**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 126 අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල වන බව) | 1. ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් පරිදි නිවැරදිව පිළියෙල කර නොතිබීම. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි නිවැරදිව සැලැසුම් නොකිරිම | 2.2.1 |
| | | 3. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.8 (ආ) |
| | | 4. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.11 |
| | | 5. අභ්‍යන්තර විගණනය | 2.13 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.6 |
| | | 2. අනුකූල නොවීම් | 2.12 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.14 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරය සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.3.(ඇ) |
| | | 2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම | 2.3.(ඉ) |
| | | 3. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.7 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම | 2.1.2 |
| | | 2. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.4 |
| | | 3. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.10 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.8 (අ) |
| | | 2. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.8 (ආ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු | පාඩු හා හානි | 2.5 |

නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමග සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

#### 2.1.1 සැලැසුම් කිරිම

---------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 22 ක් පැවති අතර, ඒ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචනය, නියාමනය හා අධීක්ෂණය කිරීම තුළින් ක්‍රියාකාරී සැලැස්මේ කාර්යසාධනය හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා කරගෙන තිබේද යන්න ප්‍රමාණවත් අයුරින් තහවුරු කරගත් බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ආ) ඇතැම් ව්‍යාපෘති අතරමඟ නතර කර තිබීම හා ප්‍රමාදවීම, ශාඛා අතර විධිමත් සම්බන්ධීකරණයක් හා සන්නිවේදනයක් නොතිබීම, යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් පවත්වාගෙන නොතිබීම හා පරිගණක තාක්ෂණය සහිත තොරතුරු පද්ධතියක් නොමැතිවීම ආදි කරුණුද අපේක්ෂිත ඉලක්ක ලබා කරගැනීමට නොහැකිවීමට මෙන්ම අධීක්ෂණය හා නියාමනය කිරීමට නොහැකි වීමටද හේතු වී තිබුණි.

#### 2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.1.3 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම**

---

1961 අංක 08 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 05 ත් 14 ත් අතර වයස් සීමාවල පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයෙකු විසින් පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි බව සඳහන් කර තිබුණද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් නොවන ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් විශාල සංඛ්‍යාවක් දිවයින පුරා පැවතුණි. එසේ වුවද, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්‍ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i) මෙම පාසල් සමාගම් පනත යටතේ හෝ ආයෝජන මණ්ඩලය යටතේ පෞද්ගලික ආයතන ලෙස ලියාපදිංචි වී තිබුණද ශ්‍රී ලංකාව තුල මූලික අධ්‍යාපනය ලබාදෙන පාසල් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ලියාපදිංචි වී නොතිබුණි. එම පාසල් සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය වෙත රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක්ද සකස් කර නොතිබුණි.

(ii) ලාභය අරමුණු කරගත් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ක්‍රමය තුළ මෙම පාසල්ද ඇතුළත්ව ඇති හෙයින් එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන්ගේ මූලික අයිතිවාසිකම් කොපමණ ප්‍රමාණයකට ආවරණය වන්නේද යන්න පිළිබඳ නිසි පසු විපරමක් කිසිදු රාජ්‍ය ආයතනයකින් සිදුනොවන බව නිරීක්‍ෂණය විය.

(iii) රජයේ පාසැලක තිබිය යුතු අවම ගුණාත්මක හා ප්‍රමාණාත්මක පිරිවිතරවලින්වත් මෙම පෞද්ගලික පාසල් පෝශිත මට්ටමක පවතින්නේද, එක් එක් මට්ටම් අනුව සිසුන් වෙත ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා සුදුසුකම් හා අත්දැකීම් ලත් ගුරු මණ්ඩලයකින් සමන්විත වන්නේද සහ අධ්‍යාපන ක්‍රමය තුළ කාලීනව සිදුවන වෙනස්කම් පිළිබඳ යාවත්කාලීන වන්නේද යන කරුණු අධීක්‍ෂණය කිරීමේ ක්‍රියාවලියක් අමාත්‍යාංශය තුළ නොපැවතුණි.

(iv) පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝණය කිරීම 1961 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වර්ෂ 57 ක කාලයක් සිදුවෙමින් පැවතෙන නමුත්, වර්තමානයට ගැලපෙන පරිදි පනතේ විධිවිධාන සංශෝධනය කිරීමට විගණිත දින දක්වාත් නොහැකි වී තිබුණි.

(v) 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල විශේෂ විධිවිධාන පනත හා 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල අතිරේක විධිවිධාන පනත අනුව රජයට පවරා නොගෙන, ජාත්‍යන්තර පාසල් රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව පෞද්ගලික කළමනාකාරීත්වයක් යටතේ පවත්වාගෙන ගොස් තිබුණි. රජයේ අනුමත ගුරු වැටුප් සඳහා රජයේ ආධාර ලබන පාසල් 36 ක් හා රජයේ අනුමත ආධාර නොලබන පාසල් 44 ක් පැවතුණි. ඊට අමතරව, ප්‍රාදේශිය ලේකම්වරුන්ගෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පුවත්පත් දැන්වීම් මගින් සපයාගෙන තිබුණු තොරතුරු අනුව දිවයින තුළ එවැනි පාසල් 286 ක් පැවැති බවත් ඒවායේ ගුරු භවතුන් 11,105 දෙනෙකු සේවය

කරන බවත් සිසුන් 117,519 දෙනෙකු අධ්‍යාපනය ලබන බවත් නිරීක්ෂණය විය. ඉන් පාසල් 82 කම සියයට අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින බව නිරීක්ෂණය විය.

**(ආ) සිසු අරුණ අධ්‍යාපනික අරමුදල**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2003 අප්‍රේල් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවට අනුව 2001 වර්ෂයේ ආරම්භ කර තිබුණු සිසු අරුණ අධ්‍යාපනික අරමුදලේ වටිනාකම රු. මිලියන 2.5 ක් සම්පූර්ණ වන විට ශිෂ්‍යත්ව ලබාදීමට අවශ්‍ය පියවර ගතයුතු බව සඳහන් වී තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට ඊට අදාළ ස්ථාවර තැන්පතුව රු. මිලියන 2.6 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය රු.මිලියන 3.9 ද ඉක්මවා තිබූ නමුත් අරමුදලේ අරමුණ ප්‍රකාරව ශිෂ්‍යාධාර පිරිනැමීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) සිසු අරුණ ගැරන්ටි ලිමිටඩ් නැමැති සමාගම් නාමය කපා හැර ඇති බැවින් එහි දේපල හා අයිතිවාසිකම් මහා භාණ්ඩාගාරය වෙත පැවරී ඇති බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි. ඒ පිළිබඳව පසු විපරම් නොකිරීම හේතුවෙන් එම සමාගම් නාමය කපා හැරීම පිළිබඳ වගකීම ඊට අදාල නිලධාරීන් වෙත පැවරෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඇ) ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගුරු තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් (Data Base) පිළියෙල කරගැනීම හා ඊට අනුබද්ධිත ගුරු සේවා කළමනාකරණය ගුරුවරුන්ට හා කාර්යාල පද්ධතියට අවශ්‍ය සේවාවන් සැපයීම යනාදී අරමුණු ඉටුකර ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (EMIS) ස්ථාපිත කර තිබුණි. ඒ සඳහා 2011 මාර්තු මාසයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළදී දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘති (EKSP) අරමුදලින් රු. 64,060,373 ක් වැය කර තිබුණි.

(ii) මෙහි පළමු පියවර යටතේ 2012 පෙබරවාරි 27 දින ගුරුවරුන් සඳහා වන දත්ත පද්ධතිය නිර්මාණය කර දීම සඳහා රු. 900,000 (බදු රහිත) මුදලක්ද, 2013 ජුනි 27 දින දෙවන පියවර යටතේ පළමුවන පියවරෙහි සඳහන් දත්ත පාදක කරගෙන මොඩියුල නවයක් නිර්මාණය කර ලබාදීමට රු. 13,877,100 (බදු රහිත) මුදලක්ද මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම පද්ධතිය නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(iii) ගුරුවරුන්ගේ මානව සම්පත් කළමනාකරණයට අදාල දත්ත රැස්කිරීම ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යනු ලබන කලාප කාර්යාල මගින් සිදුකිරීම ආරම්භ කර තිබුණි. මේ සඳහා මොරටුව විශ්වවිද්‍යාලයෙන් පවත්වාගෙන ගිය සර්වර් යන්ත්‍රය (server machine) වෙනුවට නව සර්වර් යන්ත්‍රයක් (server machine) සපයා ගෙන තිබුණු අතර, පවත්වාගෙන ගිය සර්වර් යන්ත්‍රයේ (server machine) දත්ත නව සර්වර්

යන්ත්‍රයට (server machine) මාරුකිරීමේ ක්‍රියාවලිය අවසන්කර තිබුණි. එසේ වුවද, දත්ත ඇතුළත් කිරීමේ ප්‍රමාදයන් හා ප්‍රමාණවත් පරිගණක හා අන්තර්ජාල පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම කාර්යය ද අපේක්ෂිත පරිදි ඉටුකිරීමේ අපහසුතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**(ඈ) මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර පරිගණක හා උපාංගවල පශ්චාත් වගකීම් කාලය සඳහා ගිවිසුම් ගතවීම**

---

පාසල් 1,000 ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද තාක්ෂණ විද්‍යාගාර 808 ක් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකින් අවස්ථා 05 කදී මිලදී ගන්නා ලද පරිගණක හා උපාංග 51,712 ක් සම්බන්ධයෙන් එම ආයතනය විසින් ලබාදෙන ලද වසර 3 ක වගකීම් කාලය අවසාන වීමෙන් පසුව පශ්චාත් වගකීම් කාලයකට එළඹීම සඳහා එකඟ වී තිබුණි. 2017 නොවැම්බර් 29 දින වන විට තාක්ෂණ විද්‍යාගාර 500 ක් සඳහා සපයා තිබුණු 32,000 ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් එම ආයතනයෙන් ලබාදී තිබුණු වගකීම් කාලය අවසන් වී තිබුණු අතර, තවත් විද්‍යාගාර 308 ක තිබුණු පරිගණක 19,712 ක වගකීම් කාලය 2018 ජූලි 15 දින වන විට අවසන් වීමට නියමිතව තිබුණි. භාවිත කාලය වසර 3 ක් ඉක්ම ගොස් ඇති මෙම පරිගණක හා උපාංගවල මතුවන ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් සක්‍රීය ක්‍රියාකාරීත්වයක් ලබාගැනීමට අපහසුවන බැවින්, ඒවා නඩත්තු කළයුතුව තිබුණි. එසේ වුවද, වගකීම් කාලය අවසන් වූ තාක්ෂණ විද්‍යාගාර 500 හි පරිගණක හා උපාංග 32,000 වෙනුවෙන් පශ්චාත් වගකීම් කාලයකට එකඟ වීම සඳහා රු.මිලියන 350 ක් සහ අනෙක් විද්‍යාගාර 308 හි පරිගණක හා උපාංග 19,712 සඳහා රු.මිලියන 215.6 ක් වශයෙන් එකතුව රු.මිලියන 565.6 ක් ගෙවිය යුතුව තිබුණු අතර, ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීම හේතුවෙන් පශ්චාත් වගකීම්වලට එළඹීමට මේ දක්වා නොහැකි වී තිබුණි.

**(ඉ) සුරක්ෂා සිසු රක්ෂණාවරණය**

---

අවුරුදු 5 සිට 19 දක්වා වයස් කාණ්ඩයේ පසුවන මිලියන 4.5 ක් වූ පාසල් දරුවන් සඳහා සෑම දරුවෙකුටම රුපියල් ලක්ෂ දෙකක් වටිනා ආවරණයක් ලබාදීම වෙනුවෙන් වූ සුරක්ෂා සිසු රක්ෂණ ගිවිසුම සඳහා 2017 සැප්තැම්බර් 07 දින අත්සන් තබා තිබුණු අතර, හඳුන්වාදීමේ වැඩසටහන 2017 ඔක්තෝබර් 02 දිනද ජාතික උත්සවය 2017 දෙසැම්බර් 07 දිනද පවත්වා තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග 2017 සැප්තැම්බර් 07 දින එළඹි තිබුණු ගිවිසුමට අනුව 2017 ඔක්තෝබර් 01 දින සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකම අනුව බදු සහිතව රු.මිලියන 2,700.00 ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවා තිබුණි. එහි කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පාසල් දරුවන් මිලියන 4.5 ක් සඳහා රක්ෂණාවරණය සලසා තිබුණු නමුත්, විගණනයට ඉදිරිපත් කරනු ලද තොරතුරු අනුව, 2017 නොවැම්බර් සිට විගණන අවස්ථාව වූ 2018 ජූනි 19 දින වන විට රක්ෂණ හිමිකම් ඉල්ලීම් ලැබී තිබුණේ 19,017 ක් පමණක් වූ අතර, එයින්, 15,213 ක් සඳහා ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 163.21 ක් ගෙවා තිබුණි. පාසල් සිසුන්ට හා දෙමාපියන්ට ප්‍රමාණවත් ලෙස දැනුවත් කිරීම සඳහා වැඩ පිළිවෙලවල් සකස් කර තිබුණත්, එය නිසි අයුරින් සිදුනොවීම රක්ෂණ හිමිකම් ඉල්ලීම් ප්‍රමාණය ඉතාමත් අවම මට්ටමක පැවතීමට හේතුවක් වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) සෑම ශිෂ්‍යයෙකු වෙතම සුරක්ෂා සිසු රක්ෂණ කාඩ්පත් ලබාදීමට ගිවිසුම් ගතව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් වෛද්‍ය උපදේශකවරයෙකු හෝ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ ගාස්තුවලින් සියයට 20 ක් අඩු කරගැනීමට නේවාසික රෝහල් ගාස්තුවලින් සියයට 20 ක් අඩු කරගැනීමට සහ ක්ෂණික ප්‍රතිලාභ ලබාගැනීමේදී රක්ෂිතයන්ට වන අපහසුතාවයන්ගෙන් මිදීමට නොහැකි වන බව නිරීක්ෂණය විය.

(iii) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය චක්‍රලේඛ අංක 08 ට අනුකූල වන සේ සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 හි අරමුණු ප්‍රකාරව සිදුකර නොතිබුණු පෝස්ටර්ස්, අත්පත්‍රිකා හා ඩීවීඩී සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් පෞද්ගලික සමාගම් දෙකක් සඳහා එකතුව රු.මිලියන 10.04 ක් ගෙවිය යුතුව තිබුණි.

(iv) 2017 ඔක්තෝබර් 01 දින සම්පූර්ණ පිටුවක සිසු රක්ෂණාවරණය සම්බන්ධයෙන් දැන්වීම් පළ කිරීම සඳහා පුවත්පත් ආයතන 10 කට හා නියෝජිත ආයතන 04 කට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය රහිතව මිල කැඳවුම් ලිපි යවා තිබුණු අතර, ශෆ් එම් මීඩියා පුද්ගලික ආයතනයට රු.මිලියන 4.23 ක මුදලකට එම කාර්යය පවරා තිබුණි.

(v) මෙම ප්‍රසම්පාදන කාර්යය වෙනුවෙන් තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීම් පැවැත්වූ බවට, මිල කැඳවුම් තැපැල් මගින් හෝ අතින් ගොස් භාරදුන් බවට, සැපයුම්කරුවන් අමාත්‍යාංශයට ලංසු භාරදුන් බවට හා ලංසු විවෘත කරන අවස්ථාවේ ඔවුන් සිටි බවට හෝ ලංසු විවෘත කළ බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(vi) මේ සඳහා ගුවන් විදුලි ප්‍රචාරණ වෙනුවෙන් ශෆ් එම් මීඩියා ආයතනයටම රු.මිලියන 6.83 කට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. අනෙකුත් එෆ් එම් නාලිකාවලට තැපැල් මගින් හෝ අතින් මිල කැඳවීම් යොමුකර තිබුණු බවට, ලංසු ලැබුණු බවට හා විවෘත කළ බවට, ප්‍රසම්පාදන ක්‍රියාවලියට පෙර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන තිබුණු බවට සහ දැන්වීම් ප්‍රචාරය කළයුතු දින වකවානු සඳහන් කර තිබුණු බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(vii) ගුවන් විදුලි ප්‍රචාරණය සඳහා තත්පර 30 දැන්වීම් සඳහා අනුමැතිය දී තිබුණද තත්පර 5, 10, 14, 20 හා 30 ආදී ලෙස අදාළ ප්‍රචාරය සිදුකර තිබුණි. අඩු ගුවන් කාලයක් ප්‍රචාරණය සිදුකර තිබුණු නමුත්, නියමිත මුළු කාලයටම මුදල් ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රචාරය නොකළ කාලය වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණු මුදල දළ වශයෙන් රු.මිලියන 5.07 ක් විය.

(viii) රූපවාහිනී ප්‍රචාරයද ශෆ් එම් මීඩියා ඡේදයෙහි සඳහන් පෞද්ගලික ආයතනයට රු.මිලියන 8.51 ක මුදලකට පවරා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා, ලංසු භාරදීම, විවෘත කිරීම, ලංසු ලියවිලිවල දැන්වීම් ප්‍රචාරය කළයුතු දින වකවානු, ආදි කරුණු සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ix) විකාශන සහතික පත්‍රවලට අනුව ලබාදී තිබුණු උපලේඛනයේ සඳහන් පරිදි දැන්වීම් ප්‍රචාරය කළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවූ අතර, ඒ අනුව විකාශය නොවූ කාලය වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණු මුදල දළ වශයෙන් රු.මිලියන 7.85 ක් විය.

(x) රූපවාහිනී හා ගුවන් විදුලි දැන්වීම් සකස් කිරීම රු.මිලියන 2.30 ක මිලකට පුද්ගලික ආයතනයක් වෙත පවරා තිබුණි. 2017 ඔක්තෝබර් 01 සිට 31 දින දක්වා අදාළ නාලිකාවල ප්‍රචාරය කිරීම සිදුකළ යුතු බව දන්වා තිබුණද, 2017 ඔක්තෝබර් 26 සිට

නොවැම්බර් 25 දක්වා ප්‍රචාරක කටයුතු සිදුකර තිබුණි. අදාළ කාර්යය පැවරීම ඔක්තෝබර් 27 දින සිදුකර තිබුණ නමුත්, ඊට දිනකට පෙර ඔක්තෝබර් 26 දින ප්‍රචාරක කටයුතු සිදුකර ඇති බවක් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.1.4 ජාතික පාසල්වල කාර්යසාධනය

-----------------------------------

**(අ) කොළඹ ආනන්ද විද්‍යාලය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණු තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිට තිබුණු සිසුන් විශිෂ්ට ප්‍රතිඵල අත්පත් කරගෙන තිබුණු අතර, 2016 වර්ෂයේදී තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාදී තිබුණි.

(ii) ජෛව පද්ධති තාක්ෂණවේදය හා ඉංග්‍රීසි මාධ්‍යය ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා ගුරුභවතුන්ගේ පුරප්පාඩු පැවතුණු අතර, එම විෂය ධාරාව වෙනුවෙන් සෑම පාසැලකටම ලබාදෙනු ලබන විද්‍යාගාර උපකරණ ලබාදී නොතිබුණි.

(iii) 2015 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් දක්වා එකතුව රු. 17,225,871 ක් වූ පාසල් සංවර්ධන සමිති සාමාජික ගාස්තු හිඟහිටව පැවතුණි.

(iv) 1993 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා තැන්පත් කරන ලද ස්ථාවර තැන්පතුවල වටිනාකම 2017 ජනවාරි 01 දිනට පොලියද සමඟ රු.මිලියන 43.14 ක් වී තිබුණි. සිසුන්ගේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් එම මුදලින් කොටසක් හෝ යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(v) පාසල් සංවර්ධන සමිතියට අයත් බස්රථය වර්ෂයකට සියයට 20 බැගින් වටිනාකම මත රු.3,583,196 ක මුදල මුළුමනින්ම ක්ෂය කර තිබුණි. 2016 වර්ෂයේ ගිණුම් අනුව එය ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) පාසැලේ ගොඩනැගිල්ලෙන් කොටසක පවත්වාගෙන යන ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලය වෙනුවෙන් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් 2017 සැප්තැම්බර් දක්වා විදුලි බිල්පත් පියවීමට රු. මිලියන 7.27 ක් ගෙවා තිබුණි.

(vii) 2015 දෙසැම්බර් 31 දිනැති අංක 35/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි පාසැලේ ආපන ශාලාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(viii) රථ වාහන සම්බන්ධයෙන් 2013 අගෝස්තු 30 දිනැති අංක ඊඩී/1/12/01/01- 2013 දරන චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

(ix) පාසල සතුව වාහන 08 ක් පැවතුණද, අනුමත රියදුරු තනතුරු සංඛ්‍යාව 1 ක් පමණක් විය.

(x) වාහන ධාවන සටහන් විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 1615 (අ) අනුව ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(xi) 1980 සැප්තැම්බර් 07 දිනැති අංක මු/7/63 දරන චක්‍රලේඛය ප්‍රකාරව නේවාසිකාගාරය පවත්වාගෙන ගොස් නොතිබුණි.

(xii) 2014 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන් සඳහා නිකුත් කර තිබුණු අත්තිකාරම් පියවීමේදී දින 54 සිට දින 274 දක්වා කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(xiii) 2014 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය අවසාන වන විට එකතුව රු.515,250 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

(xiv) පාසැලේ දෙවන භාෂාව ඉගැන්වීම සඳහා දෙදෙනෙක්ද, බුද්ධාගම විෂය සඳහා එක් අයෙකු සහ අ.පො.ස (උසස්පෙළ) විෂයන් සඳහා 47 ක් වශයෙන් ගුරුභවතුන් 50 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණ අතර, ගුරුභවතුන් 63 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(xv) සතියකට එක් කාල පරිච්ඡේදයක්වත් ලබාදී නොතිබුණු ගුරුභවතුන් 19 ක්, සතියකට කාල පරිච්ඡේද 10 කට වඩා අඩුවෙන් ලබාදී තිබුණු සාමාන්‍ය විෂයයන් උගන්වන ගුරුභවතුන් 15 ක්, කාල පරිච්ඡේද 10 ත් 20 ත් අතර ලබාදී තිබුණු ගුරුභවතුන් 29 ක් හා කාල පරිච්ඡේද 35 ට අඩුවෙන් ලබාදී තිබුණු සාමාන්‍ය විෂයයන් උගන්වන ගුරුභවතුන් 151 ක් පාසැල තුල සිටින බව නිරීක්ෂණය විය.

(xvi) වර්ෂ 05 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් / සේවකයින් 15 ක් ස්ථාන මාරුවීම් නොලබා දිගටම සේවයේ යෙදෙමින් තිබුණි.

(xvii) 1964 නොවැම්බර් 20 දිනැති අංක 27 දරන ආදි ශිෂ්‍ය සංගම් ව්‍යවස්ථා මාලාව, චක්‍රලේඛය හා 1995 ජුනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛය පරිදි ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස පාසැලේ විදුහල්පති පත්කර ගතයුතුව තිබුණත් එසේ පත් කරගෙන නොතිබුණි.

(xviii) 2017 වර්ෂය සඳහා ප්‍රාථමික හා ද්විතියික අංශයේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරිම සඳහා සැලසුම් කර තිබුණු රු. 854,000 ක වටිනාකමකින් යුතු වැඩසටහන් 19 කින් රු. 750,500 ක වටිනාකමකින් යුතු වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(xix) විෂය සමගාමී සංගම් සඳහා වැඩ සටහන් 19 ක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 6.27 ක් වෙන්කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

(xx) ක්‍රීඩා වැඩසටහන් 22 ක් සඳහා රු.මිලියන 5.81 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

(xxi) පාසැල තුළ පුස්තකාල 7 ක් පැවතුණද අධ්‍යාපන ලේකම්ගේ 2018 අප්‍රේල් 25 දිනැති 11/2018 දරන පාසල් චක්‍රලේඛය පරිදි පුස්තකාලය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබූ අතර පරිහරණය නොකරන බවද නිරීක්ෂණය වීය.

(xxii) මුදල් රෙගුලාසි 756 අනුව 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණු අතර, 2012, 2013 වර්ෂවල නිර්දේශද ක්‍රියාත්මක කර නොතිබුණි.

(xxiii) වසර 100 ක පමණ ඉතා පැරණි හා දුර්ලභ ගණයේ විද්‍යා උපකරණ රාශියක් සංරක්ෂණය කර තැබීමට හා කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය විශාල තොගයක් බැහැර කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(xxiv) ගුරුභවතුන් 41 දෙනෙකුගේ වැටුප් වර්ධක සහ හිඟ වැටුප් වර්ධක සැකසීමට කටයුතු කර නොතිබුණු අතර, විවිධ හේතු මත වැටුප් වර්ධක අයදුම්පත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගුරුභවතුන් 07 දෙනෙකු සඳහා නව ගුරු ව්‍යවස්ථාව අනුව අන්තර්ග්‍රහණය කිරීම, උසස් කිරීම හා හිඟ වැටුප් ගෙවීමට නොහැකි වී තිබුණි.

(xxv) 2016 වසරේදී පාසැල වෙත ලැබී තිබුණු පරිගණක 36 ක් පරිත්‍යාග ලේඛනයක සටහන් කර නොතිබුණි.

(xxvi) 2012 සැප්තැම්බර් 22 දිනැති අංක 2012/84 දරන චක්‍රලේඛයේ සඳහන් පරිදි විදුහල් භූමියේ ඉදිකරනු ලබන පිහිණුම් තටාකවල පූර්ණ අයිතිය රජය සතුවන නමුත්, ඊට අනුකූල නොවන පරිදි පෞද්ගලික ආයතනයක් විසින් පිහිණුම් තටාකය පරිපාලනය කරනු ලබන බව නිරීක්ෂණය විය.

(xxvii) සමාන්තර ශ්‍රේණිවල සිටිය යුතු සිසුන් සංඛ්‍යාවත් සිටින සිසුන් සංඛ්‍යාවත් අතර 455 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | පන්ති ගණන | සිටිය යුතු සිසුන් සංඛ්‍යාව | සිටින සිසුන් සංඛ්‍යාව | වැඩිපුර සිටින සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1-5 | 6 | 1,194 | 1,357 | 163 |
| 6-11 | 11 | 2,970 | 3,168 | 198 |
| 12-13 | .... | 1,840 | 1,934 | 94 |
| එකතුව | | 6,004 | 6,459 | 455 |

(xxviii) පාසල් සංවර්ධන සමිති බැංකු ගිණුමේ හඳුනා නොගත් සෘජු බැරකිරීම් රු. 5,815,865 ක් තිබුණු අතර, 2017 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා මුළු බැරකිරීම් 47,224,775 ක් වී තිබුණු බැවින්, සියයට 12 ක පමණ ප්‍රමාණයක් එසේ හඳුනාගත නොහැකි බැරකිරීම් විය.

(xxix) පාසල් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට විසඳා අවසන් කර නොතිබුණු මූලික විමර්ශන සහ විනය පරීක්ෂණ පහක් තිබුණි.

(ආ) **කල්මුණේ සහිරා විද්‍යාලය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 අප්‍රේල් 04 දින සිට පාසැලේ විදුහල්පති තනතුරේ කටයුතු කරන වර්තමාන විදුහල්පතිවරයා, ඒ සඳහා විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය නොවීය.

(ii) විදුහල්පතිවරයා විසින් නියෝජ්‍ය විදුහල්පතිවරු 4 දෙනෙක් පත්කර ගෙන තිබුණු අතර, එම පත්වීම් සඳහා විධිමත් අනුමැතීන් ලැබී තිබුණු බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

(iii) විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය 171 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 55 ක් වෙනුවෙන් 2017 හා 2018 වර්ෂ සඳහා නිවාඩු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iv) අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(v) 2017 හා ඊට පෙර වර්ෂ සඳහා වාර්ෂිකව පාසල් සංවර්ධන ගිණුම් සකස් කර පාසල් සංවර්ධන සමිතියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(vi) 2017 ඔක්තෝබර් 03 දින රු. 192,000 කට CCTV කැමරා පද්ධතියක් මිලදීගෙන තිබුණ නමුත්, ඒ සඳහා මිල ගණන් කැඳවා නොතිබුණු අතර, ප්‍රසම්පාදන කමිටු අනුමැති හෝ තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(vii) වාහන ගාල් කිරීමේ ස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා රු. 330,000 ක අමුද්‍රව්‍ය මිලදීගෙන තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය, තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(viii) එකතුව රු. 97,255 ක් වැයකර අවස්ථා 12 කදී ගෘහභාණ්ඩ අළුත්වැඩියා කර තිබුණු අතර, ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නොතිබුණි.

(ix) ඉදිරිපත් කර තිබුණු ප්‍රසම්පාදන ලියවිලිවල නිකුත් කළ දින, ප්‍රසම්පාදන කටයුතු අවසන් වන දින හා විවෘත කරන දින සඳහන් කර නොතිබුණි.

(x) තාක්‍ෂණ කමිටු නිර්දේශ හා කළ වැඩ සහතික රහිතව රු.59,180 ක ගෙවීම් සිදුකර තිබුණි.

(xi) 2016 වර්ෂය දක්වා පාසැලේ ප්‍රතිඵලවල වර්ධනයක් පෙන්නුම් කර තිබුණු නමුත් 2017 වර්ෂයේ ප්‍රතිඵල යහපත් මට්ටමක නොපැවතුණි. ඉගැන්වීම් පිළිබඳව සිදුකළ භෞතික පරීක්‍ෂාවේදී පන්ති කාමරයක් තුළ ඉගැන්වීම් සිදුකළ කාල පරිච්ඡේද සංඛ්‍යාව බොහෝ අවස්ථාවල කාල පරිච්ඡේද 2 ත් 3 ත් අතර පැවතුණි.

(xii) පාසැලේ ප්‍රාථමික අංශය පාසැලෙන් ඉවත් කර තිබුණු අතර, එහි සිටි ගුරුභවතුන් 15 දෙනාගෙන් 7 දෙනෙකු සඳහා කිසිදු කාර්යය පැවරුමක් සිදුකර නොතිබුණි. 8 දෙනෙකු වෙත තාවකාලික අනුයුක්තයන් ලබාදී තිබුණු අතර, මෙම ගුරුභවතුන් නිශ්චිත

රාජකාරියක නොයෙදෙන බැවින්, ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප රජයට වැය බරක් වී තිබුණි.

(xiii) ගුරුවරුන්ගේ අතිරික්තයක් පැවතුණද ඔවුන්ගේ සේවය ලබාගනු වෙනුවට විධිමත් අවසරයකින් තොරව අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත ඉගෙනුම් කාල පරිච්ඡේද පවරා තිබුණි.

(xiv) මුදල් රෙගුලාසි ප්‍රකාරව චෙක්පත් ගනුදෙනුවල ආරක්ෂිතභාවය තහවුරු කර නොතිබුණු අතර, කිසිදු සටහනක් නොමැතිව හිස් චෙක්පත්වලට පාසල් සංවර්ධන සංගම් භාණ්ඩාගාරික විසින් අත්සන් තබා තිබුණි.

(xv) ගෙවීම්, ගබඩා ලැබීම් හා නිකුත් කිරීම්, ආපන ශාලාව හා නේවාසිකාගාරය පවත්වාගෙන යාම, පිළිබඳ නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

**(ඇ) ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම**

**----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාසල්වල 1, 5 සහ 6 හැර ඉතිරි අමතර පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේදී 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුව තිබුණි. එම චක්‍රලේඛයේ 3.4 "ඒ" හි සඳහන් පරිදි ජාතික පාසල් සඳහා සිසුන් ජාතික පාසල් අධ්‍යක්ෂකවරයා විසින් අනුමැතිය ලබාදිය හැකිව තිබුණු අතර, ප්‍රශ්නගත අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. 2018 වර්ෂයේදී අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා ජාතික පාසල් විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් කර තිබුණු නිර්දේශිත නාමලේඛන සඳහා අනුමැතිය ලබාගැනීමට දීර්ඝ කාලයක් ගතවී තිබුණි. එවැනි අවස්ථා කිහිපයක විස්තර පහත දැක්වේ.

- කොළඹ 05 - ඉසිපතන විද්‍යාලය - 03, 04, 08 සහ 10 ශ්‍රේණිවලට සිසුන් 58 යි.

- මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය - 02, 03 සහ 04 ශ්‍රේණිවලට සිසුන් 49 යි.

- කොළඹ 07 - ඩී.එස්. සේනානායක විද්‍යාලය - 02 සහ 10 ශ්‍රේණිවලට සිසුන් 11 යි.

(ii) විදුහල්පතිවරුන් විසින් දෝෂ සහිත නිර්දේශිත නාම ලේඛන එවන ලද A කාණ්ඩයේ පාසල් 7 කින් පාසල් 03 ක සිසුන් 86 දෙනෙකුටද, අනුමැතිය නොලැබීම හේතුවෙන් එක් පාසලක සිසුන් 18 දෙනෙකුටද ඉල්ලා තිබුණු පාසල් අහිමි වී තිබුණි.

(iii) B කාණ්ඩයේ පාසල් 37 කින් පාසල් 13 ක නාම ලේඛන අනුමත කර යවා තිබුණු අතර, පාසල් 21 ක සිසුන් 509 දෙනෙකුට අනුමැතිය ලබාදී නොතිබුණි. දෝෂ සහිත නාම ලේඛන එවීම හේතුවෙන් පාසල් 03 ක සිසුන් 63 ක් වෙත එම පාසල් අහිමි වී තිබුණි.

(iv) C කාණ්ඩයේ පාසල් 129 කින් අනුමැතිය නොලැබීම හේතුවෙන් පාසල් 14 ක සිසුන් 541 දෙනෙකුටද, නාම ලේඛන හරවා යැවීම හේතුවෙන් පාසල් 4 ක සිසුන් 172 දෙනෙකුටද එම පාසල් අහිමි වී තිබුණි.

(v) පහත සඳහන් පරිදි ඇතැම් වෘත්තිකයින්ගේ හෝ නිලධාරීන්ගේ දරුවන්ට ජනප්‍රිය පාසල්වලට ඇතුළත් වීමට අවස්ථාව සැලසී තිබුණු නමුත් ඒ සඳහා වූ නිශ්චිත නිර්නායක, ක්‍රමවේද හෝ උපදෙස් සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය. කෙසේ වෙතත් සියළුම වෘත්තීන් හා රැකියාවල නිරතවන්නන්ගේ දරුවන්ට සම අවස්ථා නිර්මාණය වන පරිදි පැහැදිලි උපදෙස් සහිත චක්‍රලේඛයක අවශ්‍යතාවය පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| **වෘත්තිකයා / නිලධාරියා** | **ඇතුළත් කරගත හැකි ශ්‍රේණි** |
|---|---|
| වෛද්‍යවරුන් | 5, 6 හැර අනෙකුත් ශ්‍රේණි |
| අධිකරණ සේවය | 5, 6 හැර අනෙකුත් ශ්‍රේණි |
| විශ්වවිද්‍යාල ආචාර්යවරුන් | 1 ශ්‍රේණි පමණි |
| පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල | 1, 5, 6 සහ 11 හැර අනෙකුත් ශ්‍රේණි |
| පාසල්වල අධ්‍යයන කාර්ය මණ්ඩල | 1, 5, 6 සහ 11 හැර අනෙකුත් ශ්‍රේණි |
| අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් | 1, 5, 6 සහ 11 හැර අනෙකුත් ශ්‍රේණි |

**(ඇ) විදුහල්පති පුරප්පාඩු**

ජාතික පාසල් 353 න් පාසල් 259 කම විදුහල්පති පුරප්පාඩු පැවතුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 73 කි. A, B හා C ලෙස වර්ග කර තිබුණු ජාතික පාසල්වලින් ඉතා ජනප්‍රිය පාසල් 34 ක් A කාණ්ඩයට ඇතුළත් වේ. ඉන් පාසල් 23 ක හෙවත් සියයට 67 කම විදුහල්පති පුරප්පාඩු පැවතුණු අතර, මෙම සියළුම පාසල්වල විදුහල්පති තනතුරු සඳහා වැඩ ආවරණය කරන පත්වීම් සිදුකර තිබුණි. වසර කිහිපයක සිටම පැවත එන මෙම පුරප්පාඩු විධිමත්ව පිරවීමට මේ දක්වාත් නොහැකි වී තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 22 ක ගිවිසුම් ප්‍රකාරව අයකර නොතිබුණු ආපනශාලා හිඟ ආදායම රු. 855,386 ක් විය.

(ඊ) තම පාසල්වල හෝ අවට පාසල්වල හෝ ප්‍රමාණවත් ශ්‍රවණාගාර හෝ ශාලා පහසුකම් තිබියදී ජාතික පාසල් 19 ක විවිධ උත්සව සඳහා පෞද්ගලික ආයතන සතු ශ්‍රවනාගාර හෝ ශාලා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් 2017 වර්ෂය තුළදී වැයකර තිබුණු මුළු මුදල රු. 10,108,627 ක් විය.

(උ) ජාතික පාසල් 16 ක ගුරුභවතුන් 195 දෙනෙකු වෙත බැහැර දුන් පොත් ආපසු ලබාදීම ප්‍රමාද වූ අවස්ථා 360 ක් නිරීක්ෂණය වූ නමුත් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(ඖ) ජාතික පාසල් 18 ක ගුරුභවතුන් 73 දෙනෙකු ස්ථාන මාරුවීම්, විදේශගත වීම්, විශ්‍රාමයාම් හා සේවයෙන් ඉවත්වීම් වැනි අවස්ථාවලදී ආපසු භාරදී නොතිබුණු පොත් සංඛ්‍යාව 175 ක් වූ අතර, එහි වටිනාකම රු. 29,768 ක් විය. එම පොත් හෝ ඒවායේ වටිනාකම හෝ ආපසු ලබා නොගෙන එම ගුරුභවතුන් සේවයෙන් නිදහස් කර තිබුණු අතර, අනෙකුත් සිසුන් හා ගුරුභවතුන් වෙත එම පොත් පරිහරණය කිරීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

(ක) 2017 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 37 ක පාසල් සංවර්ධන සමිතියෙන්, නේවාසිකාගාර අරමුදලින්, පහසුකම් හා සේවා ගාස්තු ගිණුමෙන් හෝ ක්‍රීඩා අරමුදල්වලින් වැටුප් ගෙවමින් බඳවා ගෙන තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 208 ක් විය. ඔවුන් වෙත 2017 වර්ෂය තුළදී පමණක් ගෙවා තිබුණු වැටුප් හා දීමනාවල එකතුව රු. 28,796,964 ක් වූ අතර, එය සම්පූර්ණයෙන්ම සිසුන්ගේ දෙමාපියන් වෙත පැවරුණු වැය බරක් වී තිබුණි.

(ඒ) 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 75 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 406 දෙනෙකුගේ අතිරික්තයක් සහ ජාතික පාසල් 121 ක 1,198 දෙනෙකුගේ ඌනතාවයක් විය.

(ඔ) 2017 වර්ෂය තුළදී ගුණාත්මක යෙදවුම් සඳහා භාවිතා කිරීමට ජාතික පාසල් 67 ක් වෙත ලබාදී තිබුණු රු.8,809,983 ක ප්‍රතිපාදනයෙන් රු.3,052,471 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිව තිබුණු අතර, එම මුදල් පාසල් සංවර්ධන සමිති ජංගම ගිණුම්වල ඌණ උපයෝජිතව පැවතුණි.

(ඕ) ජාතික පාසල් 31 ක් විසින් විවිධ අවස්ථාවන්හීදී නිකුත් කර තිබුණු රු.4,690,697 තත්කාර්ය අතුරු අග්‍රිම 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

### 2.1.5 විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ගුරුභවතුන් අනුයුක්ත කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 මාර්තු මස වන විට ජාතික පාසල් 47 ක හා පළාත් පාසල් 210 ක, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් 3,423 කගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ගුරුභවතුන් 457 ක් දෙනෙකු සේවයේ යෙදී සිටින අතර ගුරුභවතුන් 114 ක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

(ආ) වෙනත් විෂයකට පත්වීම් ලැබූ සහ විශේෂ අධ්‍යාපනය පිළිබඳ විධිමත් පුහුණුවක් නොලද ගුරුභවතුන් 52 ක් විශේෂ අධ්‍යාපන ඒකකවල උගන්වනු ලබන බවද විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල්වල සාමාන්‍ය පන්ති සඳහා එම පුහුණුව ලද ගුරුභවතුන් 8 දෙනෙකු පූර්ණ කාලීනව යොදවා තිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) විශේෂ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය සඳහා බඳවාගත් ගුරුභවතුන් එම සේවයේම යෙදවිය යුතු බවට 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ සඳහන් වුවත්, එසේ පුහුණුව ලබා තිබුණු ගුරුභවතුන් 142 දෙනෙක් විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවා නොමැති පාසල්වල ඉගැන්වීම් කරනු ලබන බව නිරීක්ෂණය විය.

## 2.1.6 ළඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතිය

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ළඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා වැය ශීර්ෂ 25 ක් යටතේ රු. මිලියන 26,339 ක් වෙන්කර තිබුණි. 2017 ජුනි සිට දෙසැම්බර් දක්වා වූ අර්ධ වර්ෂය සඳහා පමණක් රු. මිලියන 37,595 ක් අක්මුදල් වශයෙන් ඉල්ලා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 14,724 ක් පමණක් ලැබී තිබුණි. මුළු වර්ෂය සඳහා ප්‍රතිපාදනය කර තිබුණු ප්‍රමාණයට වඩා සියයට 142.74 ක ප්‍රමාණයක් අවසන් අර්ධ වර්ෂය වෙනුවෙන් අක්මුදල් වශයෙන් ඉල්ලුම් කර තිබුණු බැවින්, නිසි සැලසුමකට අනුකූලව කටයුතු කර තිබුණු බවක් නිරීක්ෂණය නොවීය.

(ආ) ව්‍යාපෘතිය මගින් පන්ති කාමර, වැසිකිළි, පානීය ජලය, ගොඩනැගිලි අළුත්වැඩියා හා සිසු පුටු මේස ආදී අවශ්‍යතාවයන් අත්‍යාවශ්‍යව පැවතියද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු නොකර අවශ්‍යතාවක් නොපැවතුණු විදුහල්පති හා ගුරු නිල නිවාස ඉදිකරනු ලබන බව නිරික්ෂණය විය.

(ඇ) ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළයුතු පාසල් තෝරාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර තිබුණද, එම ක්‍රමවේදය අනුගමනය කරමින් පාසල් තෝරාගැනීමක් සිදු කර තිබුණු බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

(ඈ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් පරිදි සැලසුම් සකස්කර නොතිබුණු අතර පාසල්වල භෞතික කාර්යසාධනය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඉ) මතුගම කලාපයේ තෝරාගත් පාසල්වල සංවර්ධන කටයුතු සිදුකිරීමේදී අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබාදී නොතිබුණු පහත සඳහන් අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) මතුගම පාන්තිය මහා විද්‍යාලයේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සඳහා පානීය ජලය නොමැති බැවින් ඉදිකිරීම් අයිතම් 34 ක් යටතේ පළමු අවශ්‍යතාවය ලෙස එය හඳුනාගෙන තිබුණි. ඒ අනුව පානීය ජල පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා තිබුණු නමුත්, එසේ ලබා නොදී ඉල්ලා නොතිබුණු ආපනශාලාවක් සඳහා රු. මිලියන 20 ක් ප්‍රතිපාදනය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) දොඩන්ගොඩ මහා විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පන්ති කාමර ප්‍රමාණවත් නොවන බැවින් පළමු අවශ්‍යතාවය ලෙස පන්ති කාමර සඳහා ගොඩනැගිලි පහසුකම් ලබාදෙන ලෙස කර තිබූ ඉල්ලීම ඉටුකරනු වෙනුවට අයිතම 36 ක් යටතේ ඉල්ලීම් කර තිබූ ප්‍රමුඛතා ලේඛනයේ 16 වන ස්ථානයෙහි සඳහන් කර තිබුණු ආපනශාලාව සඳහා රු.මිලියන 18.46 ක් වෙන්කර තිබුණි.

(iii) බප/හො/පලන්නොරුව ප්‍රාථමික විද්‍යාලය සඳහා ප්‍රමාණවත් පන්ති කාමර හා අනෙකුත් අත්‍යාවශ්‍ය අංග සඳහා ඉඩකඩ නොමැති වීම හේතුවෙන් D ව්‍යාපෘතිය යටතේ මහල් ගොඩනැගිල්ලක් සඳහා ඉල්ලුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එය ලැබී නොතිබුණි.

(උ) සංවර්ධන ව්‍යාපෘති සිදුකර ඊට ආදේශක සංවර්ධන ව්‍යාපෘති ඉටු නොකිරීම හේතුවෙන් සිදුකල සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිඵලදායී නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(i) බ/සිරිමල්ගොඩ මහා විද්‍යාලය සඳහා ලබාදෙන ලද ජල මුද්‍රිත වැසිකිලිය ජලය නොමැති වීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව තිබුණි.

(ii) මො/ඇතිමලේ මහා විද්‍යාලයේ 2013 වර්ෂයේ ඉදිකරන ලද වැසිකිලි පද්ධති 2 ක් හා 2016 වර්ෂයේදී රු. මිලියන 1.9 ක් වැයකර ඉදිකරන ලද වැසිකිලි පද්ධතිය ජලය නොමැතිවීම හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකිව තිබුණි.

(ඌ) ඌව පළාතේ කර්මාන්ත 03 ක් සඳහා සාවද්‍ය කාර්යසාධන බැඳුම්කර සහ අත්තිකාරම් ඇපකර ලබා දී තිබුණු කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු. 4,825,750 ක් ගෙවා තිබුණි. 2017 ජුනි 23 දිනට එම කර්මාන්තවල භෞතික ප්‍රගතිය සියයට 12 වැනි අඩු ප්‍රමාණයක අගයක් ගෙන තිබුණු අතර, ගෙවා ඇති මුදල් ප්‍රමාණය සහ ඉටුකළ වැඩ ප්‍රමාණය සැසඳීමේදී කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණු මුදල රු. 3,742,285 ක් විය.

(එ) මුළු ජනගහනය 225,034 ක් හා සිසුන් 35,512 ක් සිටින සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක් තුල වූ කිසිදු පාසැලක් මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගෙන නොතිබුණි.

(ඒ) පවතින පාසල් සංඛ්‍යාව පදනම් කරගෙන පාසල් තෝරාගෙන තිබුණද තෝරාගත යුතු පාසල් ප්‍රමාණයත්, තෝරාගෙන තිබුණු පාසල් ප්‍රමාණයත් අතර වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පහසුකම | දිස්ත්‍රික්කය | තෝරාගෙන තිබුණු පාසල් සංඛ්‍යාව | තෝරාගත යුතුව තිබුණු පාසල් සංඛ්‍යාව | වෙනස |
|---|---|---|---|---|
| ජල | රත්නපුර | 201 | 304 | 103 |
| | කෑගල්ල | 370 | 267 | 103 |
| විදුලිය | රත්නපුර | 181 | 289 | 108 |
| | කෑගල්ල | 361 | 253 | 108 |

(ඔ) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමේදී දක්වා තිබුණු නොසැලකිලිමත්භාවය හේතුවෙන් ඇතැම් දැන්වීම් නැවත නැවත සංශෝධනය කර පුවත්පත්වල පළකිරීමට සිදුවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සඳහා 2017 සැප්තැම්බර් 30 දින වන විට රු. 6,506,810 ක් වූ පුවත්පත් දැන්වීම් පළකර තිබුණි.

(ඕ) කොන්ත්‍රාත් ගිවිසුම් ඉටු කර නොතිබුණු අවස්ථාවලදී, අත්තිකාරම් බැඳුම්කර හා කාර්යසාධන බැඳුම්කර නිදහස් කර තිබුණු අවස්ථා 35 ක් විය.

(ක) ප්‍රමාණවත් පරිදි අරමුදල් ලැබෙන බවට තහවුරු කර ගැනීමකින් තොරව විශාල කර්මාන්ත ප්‍රමාණයක් සඳහා ගිවිසුම්ගත වීම, ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීමේදී කර්මාන්ත පිළිබඳ ප්‍රමාණවත් තරම් දැනුවත් නොවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාවය හඳුනා නොගෙන කර්මාන්ත වැඩි ප්‍රමාණයක් පිරිනැමීම, අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් නොවීම හා ඉදිකිරීම් අතරමඟ නතර කිරීම ආදි හේතු මත අවලංගු කරන ලද කර්මාන්ත 17 ක් විය. තවත් කර්මාන්ත 58 ක් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතරමඟ නවතා තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.1.7 ක්‍රියාත්මක කර තිබුණු විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විදේශ ආධාර ව්‍යාපෘති දෙකක් සඳහා රු.මිලියන 4,817 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 2,619.3 ක් හා රු.මිලියන 595.64 ක් වශයෙන් රු.මිලියන 3,214.95 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,602.06 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 33.25 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(අ) දැනුම කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය

2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කර තිබුණු දැනුම කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, එය 2018 ජූනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ 2017 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ලී බඩු හා කාර්යාල උපකරණ සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතියේ රු. මිලියන 30 ක් වෙන්කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5.76 ක උපකරණ පමණක් සපයාගෙන තිබුණි.

(ii) පාසල් පාදක ඉගැන්වුම් ප්‍රවර්ධන ප්‍රදානය යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘතියෙන් රු. මිලියන 161 ක මුදලක් 2017 දෙසැම්බර් 29 දින ජාතික පාසල් 353 ක් වෙත නිදහස් කර තිබුණි. 2018 අප්‍රේල් 27 දින වනවිටත් එම මුදල් භාවිතා කර අදාළ ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. එනිසා, එම මුදල් ඌන උපයෝජිතව පැවතුණි. එසේ වුවද, ඒ පිළිබඳව සලකා බැලීමකින් හා පාසල්වල නිශ්චිත අවශ්‍යතාවන් හඳුනාගැනීමකින් තොරව 2018 පෙබරවාරි 27 දින වන විට තවත් රු. මිලියන 50 ක් එම පාසල් වෙත නිදහස් කර තිබුණි.

(iii) විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම සහ විශේෂ අධ්‍යාපන මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටපත් 1,000 ක් මුද්‍රණය කිරීම සඳහා ව්‍යාපෘතියෙන් රු. මිලියන 0.5 ක් වෙන්කර තිබුණි. එසේ වුවද, ගුරුවරුන් 75 දෙනෙක් පමණක් පුහුණු කර තිබුණු අතර, අදාල මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටපත් මුද්‍රණය කර නොතිබුණි.

## (ආ) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන

---------------------------------------------

2013 අගෝස්තු 19 දිනැති ගිවිසුම අනුව මෙම වැඩසටහන 2013 අගෝස්තු 23 දින ආරම්භ කර 2018 අගෝස්තු 31 දින අවසාන කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට එහි කාර්යසාධනය පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා රු. මිලියන 26,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 200 ක් වෙන්කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා වර්ෂ 4 ක් ගතවී තිබුණි. ශ්‍රී ලංකා රජයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 167 ක් හෙවත් රු. මිලියන 21,710 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘතියට අදාළ කටයුතු වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා වැයකර තිබුණු මුළු මුදල එ.ජ.ඩො. 98.93 ක් හෙවත් රු. මිලියන 13,342.81 ක් පමණක් විය.

(ii) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂිකව ලඟා කරගත යුතු ප්‍රධාන වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල 9 ක් ක්‍රියාත්මක වන අතර, ප්‍රතිඵල ලඟා කරගැනීමට අධ්‍යාපන ආංශික සංවර්ධන සමස්ථ වැඩසටහන සාර්ථකත්වය කරා ලඟා විය යුතු වේ. 2017 වර්ෂය අවසානයේ කාර්යසාධනය ඇගයීමේදී අමාත්‍යාංශයේ සමස්ථ මූලධන වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 47.46 ක ප්‍රමාණයක් ඉතිරිව තිබූ අතර, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 46.32 ක්ද ඉතිරිව පැවතුණි. මෙය වර්ෂය තුල ලඟා කරගත යුතු වියපැහැදම් හා සබැඳි දර්ශක ඉලක්ක ලඟා කරගැනීමට අපොහොසත් වීමට ඍජුව බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල 2 අනුව අ.පො.ස. (උසස් පෙළ) සමත්වීමේ ප්‍රතිශතය 2016 වර්ෂය සියයට 64 ක් හා 2017 දී සියයට 65 ක් දක්වා වර්ධනය කර ගතයුතු බව සඳහන් වී තිබුණි. 2016 වර්ෂයේදී අදාළ ඉලක්කය ළඟා කරගෙන නොතිබුණු අතර, 2017 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) සමත්වීමේ ප්‍රතිශතය සියයට 66 ක් වී තිබුණි. කෙසේ වුවද, සැලසුම් කළ පරිදි 2016 හා 2017 වර්ෂයන් සඳහා වෙන්කර තිබූ ඇ.එ.ජ.ඩො. මිලියන 10 අදාළ කාලය තුල ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

(iv) ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදන රු. මිලියන 4,130 ක් විය. උපයෝජනය රු. මිලියන 2120.38 ක් ඉතිරි වී තිබුණි. තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මෙම ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, උපයෝජනය නොකර තිබූ ප්‍රමාණය සියයට 51.34 ක් වූ බැවින්, අවශ්‍ය ප්‍රමාණයට සිසුන් සඳහා උපකරණ ලබාදීමට නොහැකිවී තිබුණි.

(v) 2017 වර්ෂය සඳහා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා වෙන්කර තිබුණු මුදල රු.මිලියන 1,700 ක් වූ අතර, වර්ෂය අවසානය වන විට කාර්යාල උපකරණ සඳහා රු.මිලියන 591.84 ක් පමණක් උපයෝජනය කර තිබුණි. රු. මිලියන 1,108.16 ක් ඉතිරිව පැවතුණි. සැලසුම් කර තිබුණු ඇතැම් ප්‍රසම්පාදනයන් කිසිදු හේතුවක් සඳහන් නොකර

අවලංගු කර තිබීම හා තාක්ෂණවේදය විෂය නිර්දේශ වෙනස් වීම හේතුවෙන් අළුතින් ලබාගත යුතු උපකරණ ලැයිස්තු වර්ෂය අවසාන වන විටත් සකස් කරගත නොහැකි වීම මීට හේතු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(vi) ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය ක්‍රියාත්මක වන ජාතික පාසල් 196 ක් හා පළාත් පාසල් 184 ක් වශයෙන් සමස්ත පාසල් සංඛ්‍යාව 380 ක් වී තිබුණු අතර, එම පාසල්වල ඉංජිනේරු තාක්ෂණ විෂය සඳහා ගුරු පුරප්පාඩු 85 ක්ද, තාක්ෂණය සඳහා විද්‍යාව විෂය සඳහා ගුරු පුරප්පාඩු 142 ක්ද ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා ගුරු පුරප්පාඩු 30 ක්ද වශයෙන් තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 257 ක් වී තිබුණි.

(vii) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනෙහි වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල 5 සහ වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල 06 මුළු වැඩසටහන තුළ ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණු බැවින්, ඒ වෙනුවෙන් වෙන්කර තිබුණු ඇ.එ.ජ.ඩො. මිලියන 20 ක් වූ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(viii) වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵල 7 යටතේ විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් පුහුණු කිරීම ඇතුළත්ව තිබුණි. ගත වූ වර්ෂ හතර තුළම මේ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන යොදවා පුහුණු කිරීම්වල ප්‍රමාණය අපේක්ෂා කළ මට්ටමින් ළඟා කරගෙන තිබුණද, සමස්ත පාසල් පද්ධතිය තුළ අපේක්ෂිත මට්ටමක තුලනාත්මකභාවයක් නොමැති වීම හේතුවෙන් පුහුණු කිරීම් තුළින් ලැබිය යුතු ප්‍රතිලාභ අධ්‍යාපන පද්ධතිය තුලට ගලා ඒම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි නොවීය. විගණිත දිනය වන විට ජාතික පාසල් 353 න් 259 කම විදුහල්පති තනතුරු පුරප්පාඩු වී තිබුණු අතර, වර්ෂ ගණනාවක සිට වැඩබලන හෝ වැඩ ආවරණය කරන විදුහල්පතිවරුන් පත්කර තිබුණි. සමස්තයක් ලෙස ජාතික පාසල්වල සියයට 73 ක විදුහල්පති තනතුරු මෙසේ පුරප්පාඩු වී තිබුණු අතර, ඒ තුල A ශ්‍රේණියේ ජනප්‍රිය ජාතික පාසල් 34 කින් 23 ක් විය. විගණනයේදී දිගින් දිගටම නිරීක්ෂණය වූ මෙම ගැටළුවට ප්‍රමාණවත් විසඳුම් ලබාදීමට අමාත්‍යාංශය මේ දක්වාම අපොහොසත්ව තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අනුමත කරන ලද වාර්ෂික වැඩ සැලැස්මක් අනුව ප්‍රසම්පාදන සැලසුම සකස් කර නොතිබුණු අතර, අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් අනුව ප්‍රමුඛතාවන් දී නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමද, 3.1 මාර්ගෝපදේශය අනුව උචිත ප්‍රසම්පාදන ක්‍රම තෝරාගැනීමද, 4.2.2 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන පියවර හා කාල නිර්ණය කිරීමද සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලසුමට අදාළ විස්තර අමාත්‍යාංශයේ බොහෝ ශාඛාවලින් ලබාදී නොතිබුණු අතර, එසේ වුවද ඔවුන් විසින් භාණ්ඩ ඉල්ලුම් කර තිබුණි. ඉන් කිහිපයක් ලෙස සෞඛ්‍ය හා පෝෂණ, පිරිවෙන්, විද්‍යාපීඨ, ද්විතියික පාසල් 1,000, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා, වතු පාසල් සංවර්ධන, ළඟම පාසැල හොඳම පාසැල දත්ත කළමනාකරණ යන ශාඛා පෙන්වා දිය හැක.

(ඈ) සැලසුමට ඇතුළත් කර නොතිබුණු සැපයුම් ශාඛාවේ ප්‍රසම්පාදනයන් සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 84.70 ක් වැයකර තිබුණි.

(ඉ) සැලසුම් කර තිබූ අයිතම 89 න් 17 ක් සඳහා එනම් ඉන් සියයට 19 ක් සඳහා පමණක් ගෙවීම් කර තිබුණු අතර, ඒ අනුව වර්ෂය තුලදී අපේක්ෂිත ප්‍රසම්පාදන සිදුකිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) 2017 දෙසැම්බර් 15 දිනට සංශෝධිත සැලසුමට රු. මිලියන 662.3 ක වටිනාකමැති අයිතම 34 ක් අළුතින් ඇතුළත් කර තිබුණු අතර, එම සංශෝධිත සැලසුම අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂයෙන් දින 16 ක් පමණක් ඉතිරි වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 25,737.94 ක භාණ්ඩ සැපයුම් ප්‍රසම්පාදන 115 ක් හා රු. මිලියන 53.44 ක සේවා සැපයුම් ප්‍රසම්පාදන 5 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණද, සැලසුම් ගත පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

(i) රු.මිලියන 3,377.64 ක් වටිනාකමින් යුත් සැපයුම් ප්‍රසම්පාදන 31 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සිදුකර තිබුණි. එය මුළු ප්‍රසම්පාදන සංඛ්‍යාවෙන් සියයට 27 ක් හා වටිනාකමින් සියයට 13 ක ප්‍රමාණයක් පමණක් විය.

(ii) වර්ෂය සඳහා සැලසුම් කර තිබුණු රු. මිලියන 203.85 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදන10 ක් අවලංගු කර තිබුණි.

(iii) මුළු ප්‍රසම්පාදන ප්‍රතිපාදනවලින් සියයට 26.6 ක් වූ රු. මිලියන 6862.62 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදන 9 ක් සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) සැලසුම් කර තිබුණු රු. මිලියන 5,461.99 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදන 8 ක් සම්බන්ධයෙන් 2018 අප්‍රේල් මස වන විටත් ලංසු ලියවිලි සකස් කර අවසන් කර නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

**(අ) පාසල් සඳහා පරිගණක හා ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) A,B,C වශයෙන් ලොට් 3 ක් යටතේ ඩෙස්ක්ටොප් පරිගණක 1,727 ක් ලබාගැනීම සඳහා 2017 ජුනි 14 දින ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද හා මිලදී ගැනීමට අවශ්‍ය පිරිවිතර අනුව සකස් කළ ලංසු ලියවිලි ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, එදිනම සැමට අධ්‍යාපනය

ශාඛාවෙන් අවශ්‍ය වන්නේ කුමන පරිගණකද යන්න විමසා තිබුණු බැවින්, පිරිවිතර හා ලංසු ලියවිලි සකස් කිරීමට පෙර සත්‍ය වශයෙන්ම අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණු බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

(ii) ප්‍රසම්පාදනයට අදාළ එක් එක් පියවර සැලසුම් කරන ලද කාලය තුළ සිදුකර නොතිබුණු අතර, ප්‍රමාද කාලය මාස දෙකේ සිට මාස 4 දක්වා විහිදී තිබුණි.

**(ආ) කාර්යාල උපකරණ හා බහු ප්‍රක්ෂේපන යන්ත්‍ර මිලදී ගැනීම**

---------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පාසල් සඳහා බහු ප්‍රක්ෂේපන යන්ත්‍ර 857 ක් මිලදී ගැනීම සඳහා පසුගිය වර්ෂ 03 හි වර්ෂයකට අවම වශයෙන් ප්‍රක්ෂේපන යන්ත්‍ර 100 ක් විකුණා තිබුණු ආයතනවලින් මිල ගණන් කැඳවා තිබුණි. ඒ සඳහා ආයතන 14 කින් මිල ගණන් එවා තිබුණු නමුත්, ආයතන 02 ක් පමණක් සුදුසුකම සපුරා තිබුණි. ඉන් තෝරාගෙන තිබුණු සැපයුම්කරු සුදුසුකම් සපුරා තිබුණේ අමාත්‍යාංශය වෙතම මෙම උපකරණ සැපයීමෙන් බව නිරීක්ෂණය විය.

(ii) තවත් බහුප්‍රක්ෂේපන යන්ත්‍ර 81 ක් සඳහා සිදුකරන ලද මිල කැඳවුම් අනුව ආයතන 15 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. අවශ්‍යතාවය අනුව එම 81 ට තවත් සියයට 25 ක් එකතු කර රු. 9,393,000 ක් වූ මිලකට බහුප්‍රක්ෂේපන යන්ත්‍ර 101 ක් මිලදී ගැනීම සඳහා 2017 ජුනි 30 දින ඇණවුම් ප්‍රදානය කර තිබුණි. මීට අමතරව 2017 ජුලි 19 හා අගෝස්තු 25 පිළිවෙලින් තවත් 22 ක් හා 28 ක් වශයෙන් රු. මිලියන 2.05 කට හා රු. මිලියන 2.60 කට ඇණවුම් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව මුලින් 81 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද, 151 ක් දක්වා ඇණවුම් ප්‍රදානය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.6.1 අ මාර්ගෝපදේශය ප්‍රකාරව එවැනි ප්‍රසම්පාදන සඳහා මුල් ආරාධනය සිදුකරන අවස්ථාවේදී හඳුනාගෙන නොතිබුණු බව සනාථ කර තිබිය යුතුය. එසේ වුවද, 2017 වර්ෂය වෙනුවෙන් වූ අයවැය යෝජනාවක් අනුව 13 වසර අධ්‍යාපන වැඩසටහන යටතේ පාසල් වෙත බෙදාදීම සඳහා මෙම ප්‍රසම්පාදන සිදුකර ඇති හෙයින් මුළු බහුප්‍රක්ෂේපන යන්ත්‍රවල අවශ්‍යතාව අමාත්‍යාංශය විසින් පුරෝකථනය කර නොතිබුණු බවට විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) ආරම්භක අවස්ථාවේ බහුප්‍රක්ෂේපන යන්ත්‍ර 81 ක් රු. 9,393,000 කට ඇණවුම් කර තිබුණද, ඇණවුම් කළ ප්‍රමාණයට වඩා සියයට 86 ක ප්‍රමාණයක් පසුව වැඩිපුර මිලදී ගෙන තිබුණු අතර, එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.ඇ. වගන්තිය අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ප්‍රසම්පාදනය කරන ලද මුළු ඒකක 151 වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු. මිලියන 14.04 ක් ගෙවා තිබුණි. එසේ හෙයින් මුළු අවශ්‍යතාවය එකවර හඳුනාගෙන ඉල්ලුම් කිරීම තුලින් ප්‍රසම්පාදනයේදී තරඟකාරී අවම මිලක් ලබාගැනීමට තිබූ අවස්ථාව මේ නිසා මග හැරී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) ලිවීමේ මතුපිට සහිත පුටු මිලදී ගැනීම**

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 13 වසර අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ තෝරාගත් පාසල් 43 ක් සඳහා ස්මාර්ට් පන්ති කාමර වෙනුවෙන් ලිවීමේ මතුපිට සහිත පුටු 4,524 ක් එකක් රු. 5,220 ක් බැගින් රු. 23,615,280

ක් වූ බදු රහිත මිලකට පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට 2017 සැප්තැම්බර් 19 දින නිර්දේශ කර තිබුණි.

(ii) මෙම ආයතනය පෙර අත්දැකීම් ඉදිරිපත් කර තිබුණු බව තාක්‍ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ සඳහන් කර තිබුණද, අදාළ ලංසු ලියවිලි පරීක්‍ෂාවේදී ඒ බවට සාක්‍ෂි නිරීක්‍ෂණය නොවීය.

(iii) මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අනෙක් ආයතන අතුරින් රු. 16,286,400 ක ලංසු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු පෞද්ගලික ආයතනය තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර, ඊට හේතුව වශයෙන් වසරක වගකීම් කාලයක් පමණක් ඉදිරිපත් කර තිබුණු බව සඳහන් කර තිබුණි. නමුත්, ඔවුන් විසින් වසර 3 ක වගකීම් සහතිකයක් ඉදිරිපත් කර තිබුණු බවට සාක්‍ෂි නිරීක්‍ෂණය විය.

(iv) ආදර්ශ හා පිරිවිතර නොගැලපෙන බැවින්, තවත් ආයතනයක්ද තාක්‍ෂණික ඇගයීම් කමිටුව ප්‍රතික්ක්ෂේප කර තිබුණු නමුත්, (i) ජේදයෙහි සඳහන් ආයතනයේ ආදර්ශ භාණ්ඩ අනුව පුටු ඇන්දෙහි ආනතිය වැඩිවිය යුතු බව සඳහන් කර, එම සංශෝධනයන් සිදුකිරීමෙන් අනතුරුව මිලදී ගැනීමට තීරණය කර තිබුණි. මීට අමතරව පිරිවිතර අනුව ආදර්ශවල තිබිය යුතු හා නිසාකෝ ආයතනයේ ආදර්ශ අතර සඳහන් වෙනස්කම් නිරීක්‍ෂණය විය.

| විස්තරය | තිබිය යුතු | තිබූ |
|---|---|---|
| පසුපස හේත්තු වන කොටස | රෙදිවලින් ආවරණය කරන ලද මි.මි. 25 පොලිෆෝම් ප්ලාස්ටික් පසුපස කවරය | රෙදිවලින් ආවරණය කරන ලද මි.මි. 12.5 පොලිෆෝම් ප්ලාස්ටික් පසුපස කවරය |
| ආසනය | රෙදිවලින් ආවරණය කරන ලද මි.මි. 25 පොලිෆෝම් ප්ලාස්ටික් පහල ආවරණය | රෙදිවලින් ආවරණය කරන ලද මි.මි. 12.5 පොලිෆෝම් ප්ලාස්ටික් පහල ආවරණය |
| අවසන් කිරීම | ඇන්ටිකොරෝසිව් දෙවරක් සහ තද දුඹුරු සහ එනමල් තීන්ත දෙවරක් ආලේපනය කරන ලද ටුබ්‍යුලර් ස්ටීල් | පිටතට නොපෙනෙන කොටස් අපේක්ෂිත ප්‍රමිතියට නිමකර නොතිබුණි. |

(v) ලිවීමේ මතුපිට සහිත පුටුවක ප්‍රධානම අංගය සේ සැලකෙන ලිවීමේ මතුපිටට අවශ්‍ය ලෑල්ල සඳහා අවශ්‍ය ප්‍රමිතීන් පිරිවිතරවල නිශ්චිතව සඳහන් කර නොතිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 කෙරෙහි අවධානය යොමු කර තිබුණු බව නිරීක්‍ෂණය නොවීය.

**(ඈ) උසස් පෙළ සිසුන් හා ගුරුභවතුන් සඳහා ටැබ් පරිගණක මිලදී ගැනීම**

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i). 2017 අයවැය යෝජනා අංක 92 යටතේ රු. මිලියන 5,000 ක් ප්‍රතිපාදන වෙන්කර සිසුන් හා ගුරුභවතුන් වෙනුවෙන් ටැබ් පරිගණක 195,148 ක් මිලදී ගැනීමට යෝජනා කර තිබුණි. 2017 වර්ෂයේදී එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම හේතුවෙන් ආපසු භාණ්ඩාගාරයට හරවා යැවීමට සිදුවී තිබුණු අතර, 2018 දී නැවත රු. මිලියන 5,000 ක් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ii). කෙසේ වෙතත්, 2018 පෙබරවාරි 20 දින ටැබ් පරිගණක මිලදී ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර, ඒ වන විට ප්‍රචාරණ කටයුතු හා දීමනා වශයෙන් ගෙවා තිබූ මුදල රු. 452,025 ක් විය.

**(ඉ) ග්‍රීන් බෝඩ්, මැගී බෝඩ් සහ බ්ලැක් බෝඩ් මිලදී ගැනීම**

-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i). හොඳම පාසල ළඟම පාසල වැඩසටහන යටතේ පාසල් 1, 925 ක් සඳහා මැගී බෝඩ් 18,200 ක්, ග්‍රීන් බෝඩ් 6,360 ක් හා බ්ලැක් බෝඩ් 25 ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී රු. මිලියන 155.7 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත්, එම භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා පුවත්පත් දැන්වීම් 2016 දෙසැම්බර් 30 දින පළකර තිබුණි.

(ii). ඉදිරිපත් කර තිබුණු මිල ගණන් අනුව පෞද්ගලික ආයතනයකින් එකක් රු.4,200 බැගින් මැගී බෝඩ් 18,200 ක් පමණක් රු.76,440,000 මිලකට මිලදී ගැනීමට 2017 අප්‍රේල් 24 දින තීරණය කර තිබුණු නමුත්, ග්‍රීන් බෝඩ් හා බ්ලැක් බෝඩ් මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති සේ සලකා කටයුතු කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නිශ්චිත පදනමකින් සැලසුම් සකස් කර නොතිබුණු බව නිරීක්‍ෂණය විය.

(iii). ප්‍රසම්පාදන පිරිනැමීමේ මූලික අවස්ථාවේ තීරණය කරන ලද පාසල් 1,925 වෙත බෝඩ් 18,200, 2017 ජුලි 12 දින වන විට බෙදා අවසන් කළයුතුව තිබුණද එසේ නොකර එය වෙනස් කර එක් පාසැලකට බෝඩ් 20 බැගින් පාසල් 900 ක් වෙත බෝඩ් 18,000 ක් බෙදාහැරීම සඳහා සකස් කරන ලද ලැයිස්තුවක් සැපයුම්කරු වෙත ලබාදී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන තිබුණු බව නිරීක්‍ෂණය නොවීය.

(iv). විදේශයකින් අමුද්‍රව්‍ය සපයා ගතයුතුව ඇති බව ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ඇතුළත්ව නොතිබුණු අතර, විදේශීය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළුවක් ඇති බව සඳහන් කරමින් තෝරාගත් සැපයුම්කරු දෙවරක් කාලය දීර්ඝ කිරීම් ඉල්ලා තිබුණි. ඒ අනුව 2017 සැප්තැම්බර් 12 දක්වා දින 62 ක කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණු නමුත්, 2017 ජුලි 12 සිට 2017 සැප්තැම්බර් 12 දක්වා කාලය තුළදී බෝඩ් කිසිවක් පාසල් වෙත බෙදාහැර නොතිබුණි.

(v). 2017 අප්‍රේල් 27 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් තවත් මැගී බෝඩ් 1,233 ක් එකක් රු.4,200 බැගින් රු.5,178,600 ක මිලකට එම ආයතනයෙන්ම නැවත මිලදී ගැනීමට 2017 මැයි 23 දින ඇණවුම් කර තිබුණි. මීට අමතරව, තවත් මැගී බෝඩ් 16,945 ක් එකක් රු.3,339.13 කට මිලදී ගැනීමට 2017 අගෝස්තු 30 දින වෙනත් පුද්ගලික සමාගමකට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

(vi). මීට අමතරව තවත් සමාන පිරිවිතරයෙන් යුත් මැගී බෝඩ් 16,973 ක් පාසල් 839 ක් සඳහා 20 බැගින්ද උපදේශන මධ්‍යස්ථාන 193 ක් සඳහා එක බැගින්ද,

මිලදී ගැනීමට 2017 මැයි 29 දින මිල ගණන් කැඳවා තිබුණු අතර, 2017 ජුනි 20 දින වන විට සැපයුම්කරුවන් 9 දෙනෙක් ඒ සඳහා ප්‍රතිචාර දක්වා තිබුණි. එහිදී රු. 3339.13 ක් වූ අඩුම මිල ඉදිරිපත් කර තිබුණු වෙනත් පුද්ගලික සමාගමට ඒකක 16,945 ක් රු. 56,581,558 ක් වූ බදු රහිත මිලකට 2017 නොවැම්බර් 28 දින වන විට සැපයීම සඳහා 2017 අගෝස්තු 30 දින ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එම සැපයුම්කරු 2017 වර්ෂය අවසන් වන විට අදාළ සැපයුම සම්පූර්ණ කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 20 දින දක්වා දින දීර්ඝ කරගෙනද තිබුණි.

(vii). ඉහත (ii) ඡේදයේ සඳහන් ආයතනය අදාළ සැපයුම සිදුකිරීම මාස අටකට වැඩි කාලයක් ප්‍රමාද කර තිබුණු අතර, සැපයුම නිසි පරිදි සිදු නොවන අවස්ථාවකදී කොන්ත්‍රාත් ගිවිසුමේ 34.1 අනුව ගිවිසුම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අවලංගු කිරීමට හෝ ප්‍රසම්පාදන උපදෙස් පත්‍රිකාවේ 40 වන වගන්තිය අනුව, පවතින මිලටම සියයට 25 ක ප්‍රමාණයක් වෙනස් කර (vi) ඡේදයෙහි සඳහන් පෞද්ගලික ආයතනයට පිරිනැමීමට හැකිව තිබුණද, එසේ සිදුකර නොතිබුණි. එසේ සියයට 25 ක් ඡේද අංක (ii) හි සඳහන් ආයතනයේ සැපයුමෙන් අඩුකර ඡේද අංක (vi) හි සඳහන් ආයතනය වෙත ලබාදුන්නේ නම් අමාත්‍යාංශයට එම සැපයුම නිසි වේලාවට සපයා ගැනීමට අවස්ථාව සලසා ගැනීමට ඉඩකඩ තිබුණ බවද, දළ වශයෙන් රු. 3,646,645 ක පමණ මුදලක් ඉතිරි කරගැනීමට හැකියාව තිබුණු බවද නිරීක්ෂණය විය.

## 2.3 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

------------------------------

2017 ජුනි 28 දිනැති අංක 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 6 ඡේදයේ ඇමුණුම් ප්‍රකාරව පහත වත්කම්වල තොරතුරු 2017 දෙසැම්බර් 31 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2018 අප්‍රේල් 20 දින වන විටත් එසේ කර නොතිබුණි.

| වාර්තා වර්ගය | චක්‍රලේඛය පරිදි ඇමුණුම් අංකය | ඉදිරිපත් කළයුතු දිනය |
|---|---|---|
| ඉදිකිරීම් පිළිබඳ තොරතුරු | ඇමුණුම IV | 2017.09.30 |
| ගොඩනැගිලි පිළිබඳ තොරතුරු | ඇමුණුම V | 2017.10.31 |
| ඉඩම් පිළිබඳ තොරතුරු | ඇමුණුම VI | 2017.11.30 |

**(ආ) පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම**

ජාතික පාසල්වල භාවිතයෙන් ඉවත් කරන ලද ශිෂ්‍ය පුටු, මේස, කාර්යාලීය උපකරණ හා ක්‍රීඩා උපකරණ ආදිය විශාල වශයෙන් ගොඩ ගැසී පැවතියද, සමීක්ෂණ මණ්ඩල නිර්දේශ මත හෝ 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 438 අනුව එම වත්කම් අපහරණය නොකිරීම හේතුවෙන් පොදු කාර්යය වියදම වැඩිවීමටත් මුල් අවස්ථාවේ ලබාගත හැකිව තිබූ ආර්ථික වාසි නොලැබී යාමටත් හේතුවන බව නිරීක්ෂණය විය.

**(ඇ) වාහන උපයෝජනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 1985 ජුනි මස 10 දිනැති අංක 289, 1992 අගෝස්තු 08 දිනැති අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (i), දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කළයුතුව තිබුණි. 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ඉහත කී උපදෙස් අනුව රාජ්‍ය ලාංඡනය යෙදීමටත්, ඊට අමතරව ආයතනයේ නමද සටහන් කිරීමටත් ක්‍රියා කරන මෙන් දන්වා තිබුණි. එසේ වුවද, අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii). අමාත්‍යාංශය සතු වාහන 15 ක් සඳහා 2017 වර්ෂයේදී ඉන්ධන හා නඩත්තු වියදම් වෙනුවෙන් රු. මිලියන 9.18 ක් වැයකර තිබුණද, එම වාහන පරිහරණය කිරීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii). වාහන 115 ක් සම්බන්ධයෙන් නඩත්තු කරනු ලබන ස්ථාවර වත්කම්, ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතර වාහන සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iv). අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණු වාහන 68 ක ලියාපදිංචි සහතික නොතිබුණු බැවින්, ඒවායේ අයිතිය තහවුරු කරගැනීමට නොහැකි විය.

(v). අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කරන ලද වාහන 146 ක් පරිහරණය කරන නිලධාරීන් සහ එම වාහන ගාල් කරනු ලබන ස්ථාන පිළිබඳ විස්තර/ සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(vi). වත්කම් ලේඛනයේ ඇතුළත්ව තිබුණු වාහන 35 ක් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවීය.

(vii). අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදාගෙන ඇති නමුත්, අමාත්‍යාංශයට අයත් නොවන වාහන 22 ක්, අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(viii). අමාත්‍යාංශයේ පරිහරණය සඳහා 2017 වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 4.10 ක් හා රු. මිලියන 3.99 ක් වශයෙන් එකතුව රු. මිලියන 8.09 ක් වැයකර වාහන දෙකක් මිලදී ගෙන තිබුණි.

**(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**---------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම හෝ චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. එසේ වුවත්, අමාත්‍යාංශය විසින් ජාතික පාසල් 175 ක ගුරු මධ්‍යස්ථාන 41 ක, පරිගණක මධ්‍යස්ථාන 51 ක සහ පත්තල ගෙදර ගබඩාවෙහි භාණ්ඩ සමීක්ෂණය අවසන් කර එම වාර්තා 2018 ජුනි 20 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2016 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ඉ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**---------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සලසා තිබුණු රු.මිලියන 1,192ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,098 ක් වැය කර නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.9329 ක් වූ භූමියෙහි ගොඩනැගිලි ඉදිකර තිබුණද, විද්‍යාලයීය භූමියේ හා ගොඩනැගිලිවල නෛතික අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii). වේයන්ගොඩ සියනෑ විද්‍යාපීඨය පිහිටි අක්කර 85 කින් සමන්විත ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා වූ ලිඛිත සාක්ෂි නොතිබුණි.

**2.4 බැඳීම් හා බැරකම්**

**--------------------**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම**

**-----------------------------------------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 32 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 7,758 ක බැඳීම් ඇති කර ගෙන තිබුණි.

**2.5 පාඩු හා හානි**

**-------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

2017 දෙසැම්බර් 31 දිනට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු නොකළ පාඩු හා හානි 91 ක් වූ අතර, එම පාඩු හා හානි මාස 3 සිට වර්ෂ 18 දක්වා කාල පරාසයක ඒවා විය. ඉන් අවස්ථා 36 කදී සිදුවී තිබූ අලාභයේ මුළු වටිනාකම රු. මිලියන 8.28 ක් ලෙස තක්සේරු කර තිබුණු අතර, අනෙක් හානි 55 හි අලාභය

තක්සේරු කර නොතිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අලාභ, වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් 9 තුළ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සංවර්ධනය සඳහා ජාතික හා පළාත් මට්ටමේ සම්පත් හා තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණෙන් සඳහා 2007 වර්ෂයේදී වෙනිවැල්කොළ පිහිටි පාසැලක් තෝරාගෙන තිබුණි. එහි ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අදාල ඉඩමේ සම්පූර්ණ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට 2017 වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.

(ii) සම්පත් මධ්‍යස්ථානයේ වෛද්‍ය විවේකාගාරය, පරිපාලන හා තක්සේරු කරන ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ඉදිකර තිබුණු අතර ශ්‍රවණාගාරය, පන්ති කාමර, පුස්තකාලය, ICT ගොඩනැගිල්ල, නේවාසිකාගාරය හා භෝජනාගාරය, ඉදිකිරීමේ කටයුතු, අඩ අර්ධ වශයෙන් නිමකර තිබුණි. නේවාසිකාගාර, නිල නිවාස, වෘත්තීය පුහුණු ගොඩනැගිලි, ක්‍රීඩා පිටිය හා ක්‍රීඩා මණ්ඩල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

(iii) මේ අනුව, 2007 වර්ෂයේ සිටම සැලසුම් කර තිබුණු නමුත්, වර්ෂ 10 ක් ඉක්ම ගොස් තිබූ විශේෂ අවශ්‍යතාවයන් සහිත දරුවන් වෙත මෙම සම්පත් මධ්‍යස්ථානය ඵලදායී ලෙස උපයෝජනය කළ නොහැකි තත්ත්වයක පැවතුණි. කෙසේ වෙතත්, 2019 වර්ෂයේදී උපයෝජනය කළ හැකි වන අයුරින් 2018 දෙසැම්බර් මස විවෘත කිරීමට යෝජිත බව විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ආ) 1993 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නොකඩවා දිවයිනේ සියළුම පාසල් ළමුන් වෙත නිල ඇඳුම් සඳහා ඒ ඒ වර්ණයන්ගෙන් යුතු හා වයස් කාණ්ඩයන්ට ප්‍රමාණවත් වන පරිදි එක හා සමාන ප්‍රමිතිවලින් යුත් රෙදි ලබාදී තිබුණු අතර, 2016 වර්ෂයේ සිට වවුචර්පත් ක්‍රමයට මාරුවීමට කටයුතු කර තිබුණි. 2018 වර්ෂය වෙනුවෙන් නිල ඇඳුම් බෙදාදීම සඳහා 4,165,964 ක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් හඳුනාගෙන තිබුණි. ඔවුන් වෙනුවෙන් රු. මිලියන 2,493.9 ක් වටිනාකමැති වවුචර් පත් 4,326,951 ක් රු. මිලියන 17.4 ක් වැයකර මුද්‍රණය කර තිබුණි. 2018 වර්ෂය වෙනුවෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව මගින් ගෙවා තිබුණු මුළු මුදල රු. මිලියන 3,290.4 ක් වූ අතර, වැඩිපුර ගෙවා තිබුණු රු.මිලියන 796.5 මුදල් පාවහන් තිළිණපත් සඳහා ගෙවා ඇති බව විගණනය වෙත දන්වා තිබුණි. එසේ වුවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලින් එම මුදල් පාවහන් තිළිණපත් සඳහා ගෙවා තිබුණු බව තහවුරු නොවීය.

(ඇ) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 19 කට 2018 ජූලි 12 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 1,877.6 ක් තිබුණි.

**2.7 මහජන අවශ්‍යතා හා අභියාචනා වෙනුවෙන් අමාත්‍යාංශය වෙත බදාදා දින පැමිණෙන මහජන අපේක්ෂා ඉටු කරලීම**

අමාත්‍යාංශය මගින් තම අවශ්‍යතාවයන් ඉටු කරගැනීම සඳහා 2017 ජුනි මස සිට අගෝස්තු මස දක්වා බදාදා දිනවල පැමිණ තිබුණු මුළු සංඛ්‍යාව 6,963 ක් විය. එය දිනකට 565 සිට 935 දක්වා පරාසයක පැවතුණි. ඒ පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i). එසේ විවිධ පළාත්වලින් පැමිණි පුද්ගලයින් පිළිබඳ 2017 අගෝස්තු 16 දින සිදුකරන ලද සමීක්ෂණයට අනුව, එකම හේතුව වෙනුවෙන් වාර 2 සිට 15 දක්වා ප්‍රමාණයක් පැමිණ එක් එක් නිලධාරීන් හමුවී තිබුණද ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරගැනීමට නොහැකි වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ii). මහජන පැමිණිලි ලේඛනගත කිරීම, පරිගණක ගතකිරීම හා ගොනුගත කිරීම සිදුවන නමුත්, අදාල ගැටළු විසඳී නොතිබීම හේතුවෙන් යළි යළිත් ඔවුන් පැමිණෙන බැවින්, ඒ පිළිබඳව ක්‍රමානුකූලව පසු විපරමක් සිදුකරන බව නිරීක්ෂණය නොවීය.

(iii). අදාළ පැමිණිලි පිළිබඳ සවන් දීම හා විසඳීම සඳහා එක් එක් ගැටළු සම්බන්ධයෙන් ක්‍රියාකරන නිලධාරීන් හමුවීමට නොහැකිවීම හේතුවෙන් මහජනයාට ප්‍රශංසනීය සේවාවක් ඉටුනොවන බව නිරීක්ෂණය විය.

(iv). ගැටළු නිශ්චිතව හඳුනා නොගැනීම හා එක සමාන ගැටළු සම්බන්ධයෙන් සියළු පුද්ගලයින් වෙත එකම ආකාරයෙන් නොසැලකීම, ඍජු පිළිතුරු නොලැබීම හා නිසි ස්ථානයකට යොමු නොකිරීම පිළිබඳ ගැටළු පවතින බව නිරීක්ෂණය විය.

**2.8 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 28,875 | 28,656 | 219 | 0.76 |
| | මුලධන | 8,484 | 7,544 | 940 | 11.08 |
| | **එකතුව** | **37,359** | **36,200** | **1,159** | 3.10 |
| 2014 | පුනරාවර්තන | 26,175 | 26,105 | 71 | 0.27 |
| | මුලධන | 15,057 | 14,680 | 376 | 2.5 |
| | **එකතුව** | **41,232** | **40,785** | **447** | 1.08 |
| 2015 | පුනරාවර්තන | 41,104 | 40,747 | 357 | 00.87 |
| | මුලධන | 17,347 | 15,536 | 1,811 | 10.44 |
| | **එකතුව** | **58,451** | **56,283** | **2,168** | 03.71 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 167,250 | 45,396 | 121,854 | 72.86 |
| | මුලධන | 31,336 | 15,115 | 16,222 | 51.77 |
| | **එකතුව** | **198,586** | **60,511** | **138,076** | 69.53 |
| 2017 | පුනරාවර්තන | 54,985 | 49,139 | 5,846 | 10.63 |
| | මුලධන | 52,577 | 27,623 | 24,954 | 47.46 |
| | **එකතුව** | **107,562** | **76,762** | **30,800** | 28.63 |

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**---------------------------------------------------**

මූලධන වැය විෂයයන් 15 ක් සහ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 6,163.56 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**----------------------------**

වැය විෂයයන් 45 ක් සඳහා එකතුව රු.මිලියන 22,121.71 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 6,270.92 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

**---------------------------------------------------------------------**

පරිපූරක අයවැය ඇස්තමේන්තුවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ට ටැබ් පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 5,000 ක්ද, කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් වෙනුවෙන් රු.මිලියන 6 ක් හා කුලී පදනම මත පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 5,000 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 10,006 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 12601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 1,700 | 1,585 | 980 | 1,038 | 3,500 | 2,497 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 223.5 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ තුළ වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවැත එන ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා මිය ගිය හා සේවය අතහැර ගිය, වැඩ තහනම් කළ හා වෙනත් රු.මිලියන 112.20 ක හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශය අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර එකතුව රු. මිලියන 1.2 ක නිරවුල් නොවූ දෝෂ පැවැතුණි. ඒ තුළ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රු. 138,775 ක් වූ ශේෂද විය.

(ඇ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂය ලෙස රු. මිලියන 2.7 ක් දක්වා තිබුණද, ලැබීමට ඇති ණය කාල විශ්ලේෂණය අනුව එය රු. මිලියන 1.8 ක් විය. ඒ අනුව රු. 829,420 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර හඳුනා නොගත් වෙනස රු. මිලියන 1.4 ක් විය.

(ඉ) 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 හි ඡේද අංක 3.2 හි උපරිම වියදම් සීමාව තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතී නම් පළාත් සභාවලින් මාරුවී පැමිණෙන නිලධාරීන්ගේ ණය ශේෂ එක්වරම පවරාගැනීම කළයුතු විය. එලෙස ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නම් ස්ථාන මාරුවී පැමිණෙන නිලධාරීන්ගේ ණය ශේෂ පවරා නොගත යුතු බවත්, සෑම මසකම ඔවුන්ගේ වැටුපෙන් අයකරනු ලබන ණය වාරික හා පොළිය අදාල පළාත් සභාවට මුදලින් ප්‍රේෂණය කළයුතු බවත් සඳහන් වේ. එසේ වුවද, පළාත් සභාවලින් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අදාළ පළාත් සභාවෙන් එකවර අයකර ගැනීමට හෝ වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා මධ්‍යම පළාත් අධ්‍යාපන කාර්යාල නිලධාරීන් 139 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන 5.2 ක මුදලක් පළාත් සභාවලට පැවරිය යුතු ශේෂ වශයෙන් පැවතුන බව නිරීක්ෂණය විය.

## 2.10 පොදු තැන්පත් ගිණුම්

------------------------

අමාත්‍යාංශය යටතේ  වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 819 ක් විය. ඉන් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 9.37 ක්වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | මුදල් රෙගුලාසි | නිරීක්ෂණය |
|---|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645(අ) හා 1647 (ඉ) | විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

## 2.12 අනුකූල නොවීම්

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි  යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 1.2, 13.2 හා 22.1.1 වගන්ති | (i) අමාත්‍යාංශය, ජාතික පාසල්, විද්‍යා පීඨ හා අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතනවල විසඳා අවසන් කර නොතිබුණු විනය ගැටළු සංඛ්‍යාව 554 ක් විය. විදුහල්පති තනතුරුවලට අදාළව 110 ක්ද, අනෙකුත් අධ්‍යයන හා අනධ්‍යයන තනතුරුවලට අදාළව 444 කද විනය ගැටළු වලින් එය සමන්විත වී තිබුණි. |

(ii) විසඳා නොතිබුණු විනය ගැටළු අතර වර්ෂ 9 ඉක්මවූ වර්ෂ 2 ක්ද, වර්ෂ 5 ඉක්මවූ 40 ක්ද, 2 ත් 5 ත් අතර 101 ක්ද පැවතුණි.

(iii) මෙම විනය ගැටළු තුල පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම් සම්බන්ධ පැමිණිලි 107 ක් පැවැති අතර, 2012 වර්ෂයේ සිට පැවත එන මෙම පැමිණිලිවලින් 16 ක් පමණක් විසඳා තිබුණි.

(iv) විසඳා අවසන් නොකරන ලද විනය ගොනු කිහිපයක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවන්වලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

* මීගමුව නිවුස්ටඩ් බාලිකා විද්‍යාලයේ අක්‍රමිකතා සම්බන්ධයෙන් අභ්‍යන්තර විශේෂ විගණන පරීක්ෂණයක නිර්දේශ අනුව මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීමට වර්ෂ පහකට වැඩි කාලයක් ගතකර තිබුණි.

* වූදිත නිලධාරියකුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර වසරක් ඇතළත පරීක්ෂණ නිමකර විනය නියෝග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වුවත්, ED/05/92 (9) 2013 (16) දරන විමර්ශන වාර්තාව හා ED/05/72/02/04/383 දරන විනය ගොනුව සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

* කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයට 2014 වර්ෂයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් එවකට සිටි විදුහල්පතිවරයාට විරුද්ධව පැමිණිලි කර තිබුණි. විනය පරීක්ෂණ අනුව 2016 මැයි 24 දින චෝදනා පත්‍ර නිකුත් කර තිබුණද, ඒ අනුව විනය ක්‍රියාමාර්ග අවසන් කර නොතිබුණි. 2017 ජුලි 18 දින වසර 60 සම්පූර්ණ වීම හේතුවෙන් ඒ පිළිබඳ අවධානය යොමු නොකරම ඔහුව විශ්‍රාම ගන්වා තිබුණි.

| | | |
|---|---|---|
| (ii) | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1.1 | නිවාඩු සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු නමුත්, ඊට අනුකූල නොවන පරිදි 2017 වර්ෂය තුළදී ජාතික පාසල් 27 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 107 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු මුළු නිවාඩු දින ගණන 3,428 ක් විය. |
| | ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 2 | 2017 වර්ෂය තුළදී ජාතික පාසල් 111 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 536 දෙනෙකු දින 11,938 ක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නමුත් වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ | |
| (i) | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 | අදාළ චක්‍රලේඛ විධිවිධාන හා අංක 10/2377/436/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කවර හෝ රජයේ පාසැලක වසර 08 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර ඇති ගුරුවරුන් ස්ථානමාරු කළයුතු වුවත්, නියැදි පරීක්ෂණවලදී ඊට අනුකූලව ස්ථානමාරු ලබානොදුන් ගුරුභවතුන් විය.<br><br>(i) චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 127 ක ගුරුභවතුන් 4,123 දෙනෙකු වර්ෂ 08 ත් 32 ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා එකම පාසැලක සේවයේ යෙදී තිබුණි.<br><br>(ii) ජාතික පාසල් 118 ක ගුරුභවතුන් 786 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසල් 40 ක ප්‍රාථමික ගුරු පුහුණුව නොලද ගුරුභවතුන් 163 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි. |
| (ii) | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් පරිදි ජාතික පාසල් 89 ක සමාන්තර ශ්‍රේණිවල සිටිය යුතු සිසුන් සංඛ්‍යාව ඉක්මවා සිසුන් 5,504 ක් බඳවාගැනීමට කටයුතු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 2013 නොවැම්බර් 07 දිනැති අංක 38/2003 දරන චක්‍රලේඛය | (i). චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන තිබුණු, 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 123 ක පවතින ගුරු ඌනතා 1,775 ක් හා ජාතික පාසල් 93 ක පවතින ගුරු අතිරික්තතා 874 ක් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii). චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසැලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 10 ක්වත් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත් ජාතික පාසල් 71 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 146 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණු අතර ජාතික පාසල් 03 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 05 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව සතියකට 02 ත් 06 ත් අතර පරාසයකින් යුක්ත විය.<br><br>(iii). චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 12 ක්වත් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත් ජාතික පාසල් 29 ක සහකාර විදුහල්පතිවරුන් 58 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි.<br><br>(iv). චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 ක කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ කාර්යයෙහි නියුක්ත කර විය යුතු වුවද, ජාතික පාසල් 94 ක ගුරුභවතුන් 811 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණු අතර ජාතික පාසල් 95 ක ගුරුභවතුන් 699 දෙනෙකු වෙත ඉගැන්වීම් කාලපරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි. |

**2.13 අභ්‍යන්තර විගණනය**

-------------------------

අමාත්‍යාංශයේ ස්ථාපිත කර තිබුණු අභ්‍යන්තර විගණන අංශයෙන් 2017 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේදී විශේෂ වැදගත්කමක් දරන පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(අ) පාසල් නිල ඇඳුම්, පෙළපොත් හා අනෙකුත් සුභසාධන වියදම්

(ආ) 5 වසර ශිෂ්‍යාධාර ගෙවීම්

(ඇ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු.

(ඈ) පාසල්වල සෞඛ්‍ය, පානීය ජලය, විදුලිය හා ගොඩනැගිලි නඩත්තුව හා ඉදිකිරීම්

(ඉ) පළාත් හා කලාප ICT මධ්‍යස්ථාන ඉදිකිරීම.

(ඊ) ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ සැපයීම.

(උ) මෑතකාලීන ව්‍යාපෘතිවලට ඇතුළත් නොවූ පාසල් 1,360 ක පහසුකම් දියුණු කිරීම.

(ඌ) අමාත්‍යාංශයේ ගොඩනැගිලි ඉදිකිරීම.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

### 2.14.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 31,796 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 127,290 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 4,855 | 2,974 | 1,881 | - |
| (ii) | තෘතියික මට්ටම | 16,568 | 13,866 | 2,702 | - |
| (iii) | ද්විතියික මට්ටම | 252,357 | 224,697 | 69,159 | 41,499 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 8,876 | 8,253 | 623 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | - | 01 | - |
| | එකතුව | 282,657 | 249,790 | 74,366 | 41,499 |

**2.14.2** 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති xviii පරිච්ඡේදයේ 193 වන කොන්දේසිය අනුව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථාන මාරුකිරීම්වලට යටත් වන අතර, එම කොන්දේසියට හා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් ක්‍රියා කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වර්ෂ 05 සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටි නිලධාරීන් සංඛ්‍යාව 273 දෙනෙකු වූ අතර අධ්‍යාපන පරිපාලන සේවය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.